මාතර මහා නගර සභාව - 2021
-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර මතය**

මාතර මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (එ), (ඒ),(ඔ) හා (ඕ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර තිබූ එකතුව රු.2,933,103 ක් වූ ස්ථාවර වත්කම්වල පිරිවැය නිශ්චිත හඳුනා ගැනීමකින් තොරව පළමු ලැබීම පලමු නිකුත් කිරීමේ පදනම මත ඉවත් කර තිබුණි. | අදාල වත්කම්වල වටිනාකම් නිශ්චිතව හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් නොතිබුණු බැවින් පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් ක්‍රමය යටතේ ගැලපීම් කරන ලද බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී රු.56,500,000ක වියදම්වලට අදාළව ඉදිරිපත් කර තිබූ පරිපූරක ඇස්තමේන්තු වටිනාකම සමුච්චිත අරමුදල හර කර වෙනත් ආදායම් බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.56,500,000 කින් වැඩිපුර දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තයත් පරිපූරක ඇස්තමේන්තුවට අදාල අතිරික්තයත් වෙන වෙනම පෙන්නුම් කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් ගත වී නොතිබූ රු.15,800,000 ක මිල දී ගැනීම් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා තිබුණි. | බස් රථයක් සහ ජීප් රථයක් මිලදී ගැනීමට අදාලව මිල ගණන් කැඳවා 2021 දෙසැම්බර් 17 දින මිල ගණන් විවෘත කර තිබීමත්, ගල් රෝලක් මිලදී ගැනීමට අදාලව 2021 නොවැම්බර් 25 දින සැපයුම්කරු වෙත ඇණවුම ලබා දී තිබීමත් හා ජෙනරේටරය මිලදී ගැනීම් ක්‍රියාවලිය 75% ක් පමණ 2021 වර්ෂය අවසන් වනවිට අවසන් කර තිබීමත්, නිසා ණයහිමි ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ බව. | |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2017 වර්ෂයේදී මුද්දර ගාස්තු ඌන වෙන් කිරීම රු.22,700,303 ක් ද, 2018 හා 2019 වර්ෂයේ අධි වෙන් කිරීම රු.38,227,550 ක් ද සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා අඩුවෙන් ඇස්තමේන්තු කර තිබූ රු.2,261,433.70 ක් හා 2017 හා 2019 වර්ෂ සඳහා වැඩියෙන් ඇස්තමේන්තු කර තිබූ රු.18,757,026 ක් හා රු.13,394,884 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම මඟින් ගැලපීම් කර තිබූ බව. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට 2021 පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.14,000,000 ක් වටිනා මාතර බස්නැවතුම් පොළෙහි අපජල හා මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක නොකිරීම නිසා ව්‍යාපෘතිය ලබන වසර සඳහා අවිච්ඡේද කර නොතිබුණද ලැබිය යුතු ණයගැතියන් ලෙස රු.14,730,703 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම කර්මාන්තය සඳහා සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතවී 2021 දෙසැම්බර් 03 දින වැඩ ආරම්භ කර ඇති ණයගැති වෙන් කිරීම් සිදු කර ඇති බව. | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමකට ලැබුණු මුද්දර ගාස්තු රු.19,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් මස බැංකු ප්‍රකාශය 2022 ජනවාරි මස ලද බවත්, බැංකු ප්‍රකාශය පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කර ගන්නා තෙක් ගැලපීම් නොකළ බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ආසියානු සංවර්ධන බැංකු ණය (යන්ත්‍ර සූත්‍ර හා උපකරණ) ශේෂය වූ රු.1,261,530 ට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ණය පොලිය වූ රු.1,140,000 ක් සහ පසුගිය හා සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ණය මුදල සම්බන්ධයෙන් තොරතුරක් සොයා ගත නොහැකි බවත්, නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2019 දෙසැම්බර් 31 දිනට රු. 1,142,000 ක පොළියක් සටහන් කර 2020 පෙබරවාරි 06 දිනැති ලිපිය එවා තිබුණද ඉන් පසුව මෙතෙක් ඒ සම්බන්ධයෙන් දැනුම්දීමක් කර නොමැති බවත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ගෙවීම් කටයුතු සිදු කරන බව. | |
| (ඌ) | නගර සභා කොමසාරිස් නිල නිවස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරු සමග රු.12,923,273ක් වූ මුදලකට ගිවිසුම් ගත වී තිබුණ ද, රු.15,673,438 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම මත පදනම්ව ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.2,750,165 ක් අඩුවෙන් ද ණයහිමියෝ වැඩියෙන්ද දැක්වුණි. | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම මත ණයහිමි ප්‍රතිපාදන සලස්වා ඇති බව. | |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණ ණය ගිණුමේ පැවති රු.49,774,022 ක ශේෂය වෙනුවෙන් පොලී ගණනය කර සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්ගත කර නොතිබුණි. | ගිවිසුම්වල පවතින ගැටළුකාරී තත්වයන් නිරාකරණය කර දෙපාර්ශවයන් අතර එකඟතාවයකට පැමිණි පසු ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කරන බව. | ණය පොලී ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | වාණිජ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය වූ මුදලින් සියයට 35 ක් හෙවත් රු.37,871,539 ක් කඩ කාමර ටෙන්ඩර් කර ලබාගත් එක්වන් මුදලින් (Key Money) ගෙවා දැමිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල් පියවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ගනු ලබන තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | එක්වන් මුදලින් වැය වූ මුදල් ගෙවා දැමිය යුතුය. |
| (ඔ) | ඉකුත් වර්ෂයේදී ඉදිකර තිබුණු රු.4,576,000ක් වටිනා ඉන්ධන පිරවුම්හල් වියදම සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සභාව විසින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම් ගත කිරීමක් සිදු නොකරන බවත්, රු. 950,000 ක් වූ ඉන්ධන පොම්පයේ වටිනාකම 2022 වර්ෂයේ ජර්නල් සටහන් මගින් යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | අදාල ප්‍රාග්ධන වියදම යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් එකතුව රු.47,949,392 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි. | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල සඳහා මෙතෙක් ගෙවීම් සිදුකර නොමැති බවත්, අදාල විශ්‍රාමිකයන් ජීවත්ව සිටීද යන්න පිළිබඳව තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙන්වා ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම තීරණය ලැබෙන තෙක් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොමැති බව. | ණයහිමි ප්‍රතිපාදන සැලසිය යුතුය |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා ලේඛන/ උපලේඛන අනුව වටිනාකම අතර රු.184,902,984 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා කේවල ශේෂ ලැයිස්තුව ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.449,948,532 ක් වූ ගිණුම් විෂයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.142,443,317 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.91,331,461 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

#### (අ) වරිපනම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වරිපනම් ඒකක 34121 න් වරිපනම් ඒකක 20821 කට අදාලව රු.60,689,595 ක හිඟයක් පැවති අතර එයින් රාජ්‍ය ආයතනවලට අදාල දේපල 442 කින් රු.7,067,688 ක් අයවීමට තිබුණි. | හිඟ ආදායම් අය කිරීම පිළිබඳ අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

#### (ආ) විනෝද බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.316,247 ක් හිඟව පැවතුණි. | රටේ පැවති වාතාවරණය අනුව සිනමා ශාලා වසා තිබූ බැවින් වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය අය කර ගැනීමට නොහැකි වූ බවත්, එහෙත් වර්ෂයට අදාල බිල් කිරීම නියමිත පරිදි අයකර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**(ඇ) කඩ කුලී**

----------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කාමර 463 ක් හා කඩ අල්ලි 106 ක් බදු දී තිබූ අතර, එයින් බදුකරුවන් 436 දෙනෙකුගෙන් රු. 60,716,741 ක හිඟ ආදායමක් පැවති අතර එම හිඟ ආදායම අය කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ පිළිබඳව විටින් විට බදුකරුවන් දැනුවත් කර වාරික වශයෙන් අය කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**(ඇ) බිම්බදු**

-------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ඔක්තෝබර් 31 දිනට සභාව සතු දේපළ බිම් බදු දී තිබූ බිම් බදුකරුවන් 283 දෙනෙකුගෙන් එකතුව රු.8,132,980 ක මුදලක් සභාවට අයවීමට තිබුණි. | ලේඛනගත බදුකරුවන්ගේ හිඟ බදු මුදල් සම්බන්ධයෙන් සමථ මණ්ඩලය වෙත යොමු කරන ලද බව. | හිඟ බදු කුලී කඩිනමින් අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

මහා නගර සභා ආඥාපනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර මහා නගර සභාවේ කසළ ප්‍රවාහනයට යොදවා ඇති ට්‍රැක්ටර් හා ගලි බවුසර් රථවල GPS පද්ධති සවිකිරීමට එක්තරා දුරකථන සමාගමකට 2019 වර්ෂයේදී රු.177,212 ක් ගෙවා තිබූ අතර, 2019 ජූලි සිට 2020 සැප්තැම්බර් මස දක්වා මාසික බිල්පත් වෙනුවෙන් රු.171,670 ක් වැයකර තිබුණි. එහෙත් පද්ධතිය ආරම්භ කර වසර දෙකක කාලයක් ගතවී ඇතත් කසළ කළමනාකරණ කටයුතුවල පවතින දුර්වලතා හඳුනා ගනිමින් ඒවා නිවැරදි කර ගැනීමට මෙම පද්ධතිය භාවිතා කර නොතිබුණි. | සේවා බිඳවැටීම් හා එම සේවාව සක්‍රීය කර ගැනීම ප්‍රමාදවීම් වැනි හේතූන් මත 2019 නොවැම්බර් මස සිට මෙම පද්ධතියට අදාලව වාර්තා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වූ බව. | GPS පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මාතර බස් නැවතුම්පොළ තුළ හා අධිවේගී බස්රථ නැවතුම්පොළ තුළ සභා අනුමැතියකින් තොරව පවත්වාගෙන යනු ලබන අනවසර වෙළඳසැල් 07 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීති නිළධාරී උපදෙස් මත අදාල කටයුතු සිදු කරමින් පවතින බව. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| | සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතු වන කසල කළමනාකරණය සඳහා දිරන කසල භාවිතයෙන් කාබනික පොහොර නිපදවීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු අතර, කසල භාවිතයෙන් ජීව වායු නිෂ්පාදනය කර විදුලි බලය උත්පාදනය කිරීම හා නොදිරන කසල හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. දෛනිකව එකතු වන කසල වර්ගීකරණය කිරීමෙන් තොරව කොටවිල කසල අංගනය වෙත බැහැර කර එම කසල පස්වලින් යට කිරීම සඳහා 2018 මැයි 18 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුල එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලියට ලබාගෙන පැය 7537.30 ක් සේවයේ යෙදවීම සඳහා රු.36,568,262 ක වියදමක් සභා අරමුදලින් දරා තිබුණි. | දිරන හා නොදිරන කසළ වශයෙන් වර්ගීකරණය කර එක්රැස් කරනු ලබන බවත්, කොටවිල සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට රැගෙන යන දිරන කසළවලින් පවතින ධාරිතාවය අනුව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන බවත්, පොලිතීන්, ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට යොමු කරනු ලබන බවත්, ඉතිරි කසළ තෝරා ගත් විශේෂිත ස්ථානයක තුනීකර පස් යොදා වැසීම සිදු කරනු ලබන බව. | විධිමත් කසල කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය මගින් මාතර මහා නගර සභාවට ආසියානු ණය සංවර්ධන බැංකුව මගින් බස් නැවතුම්පොළ, වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ ලබා ගැනීමේ ණය මුදලින් 2019 වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය හා පොලිය රුපියල් මිලියන 55.06 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 07/03/12/Rev/matara දරන හා 2020 පෙබරවාරි 06 දිනැති ලිපිය අනුව එම ශේෂය රුපියල් මිලියන 148.5 ක්වූ අතර වෙනසට හේතු සොයා බලා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | මෙම ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව. | වෙනසට හේතු සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 07/03/ Rev/matara දරන හා 2001 මැයි 14 දිනැති ලිපිය ප්‍රකාරව වාණිජ සංකීර්ණය සඳහා වැය වූ මුදලින් සියයට 35 ක් එනම් රු. 37,871,539 ක මුදල කඩ කාමර ටෙන්ඩර් කර ලබාගත් පෙර ගෙවීම් මුදලින් (Key Money) එකවර ගෙවා දැමිය යුතු බව දක්වා තිබුණද වර්ෂ 20 කට අධික කාලයක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ද කිසිඳු ක්‍රියාමාර්ගයක් ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් ලබාගත් රු.42,314,532 ක මුදලක් බැංකු 02 ක අවස්ථා 7 කදී ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. | අදාල මුදල් සම්බන්ධයෙන් සාකච්ඡා කර එහිදී ගනු ලබන තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාතර මහා නගර සභාවේ නගරාධිපතිට සහ මන්ත්‍රීවරුන් හට මහා නගර සභා ආඥාපනත, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා අනෙකුත් චක්‍රලේඛ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් සිටිය දී අමතර උපදේශකයෙකු බඳවා ගෙන උපදේශක දීමනා වශයෙන් රු.313,333 ක් ගෙවා තිබුණි. | සභා තීරණය මත බඳවා ගෙන ඇති අතර දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ විරෝධතාවයක් නොමැති බව. | පවතින කාර්යමණ්ඩලය යොදා ගෙන රාජකාරි ඉටු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් කාණු සැකසීමේ කර්මාන්ත 42 කට අදාලව හැඩයම් සැකසීමේදී පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ගෙවීම් කිරීමේදී සමාන වැඩ විස්තරයක් සහිත රේටයක් ලෙස දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් ct-036 යටතේ හඳුන්වා දුන් රු.841 ක රේටය වෙනුවට, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අඟල් 01 (මිලි මීටර් 55) ඝනකමට ඉරන ලද දෙවන පන්තියේ දැව ලෑලි භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ST- 057 යටතේ හඳුන්වා දී තිබූ රු.1,108 රේටය ද මිලි මීටර් 25 ඝනකමට පළමු පන්තියේ ඉරන ලද දැව වලින් හා අඟල් 02 (මිලි මීටර් 50x50) දැව උපයෝගී කර ගෙන දිවත් මූට්ටු (Tongue & Grooved) යොදා සුමට නිමාවක් ඇති වන පරිදි හැඩයම් සැකසීම සඳහා ST-112 යටතේ හඳුන්වා දී තිබූ 1,377.85 රේටය ද භාවිතා කර ගෙවීම් කිරීම නිසා පිළිවෙලින් වර්ග මීටරයක් සඳහා රු.267 හා 536.85 ක් බැගින් හැඩයම් වර්ග මීටර් 7232.56 ක් සඳහා රු.3,121,281 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතුය. |